# දඹදෙණිය යුගයේ නගර සැලසුම්කරණයේ සුවිශේෂතා පිළිබඳ අධ්‍යයනයක්

A study on the characteristics of urban planning during the Dambadeniya period

යූ.බී. අනූපමා


## Abstract

After the collapse of the Kindoms of Anuradhapura and Polonnaruwa ,which belong to the first urbanization phase ,the second city of Lanka began.The Dambadeniya yuga,which began in 1232 AD, lasted for nearly five decades. During these periods, four sinhalese kings had to nurture a bright light in the political, economis,ciltural, social and literary fields. Among the various eras of history, it is felt that Dambadeniya era is a chapter that deserves the mÈt attention of scholars. There are two things that should be multi-dimensional like Dambadeniya era .The reason for discussing the matter in a more multidimensional manner is that this kingdom was built with the coronation of king Vijayabhahu and the city planning was done in a very unique way in this kindom due to the need to build a safe kingdom through the invasions of the Pollonaruwa period.There through this research,a semi study is conducted on how the planning of the city of Dambadeniya was created, where security and other need are met. Here, the research problem is to discuss whether there is a unique city plan created during the period of the Dambadeniya Kingdom, which was the first stage of the second city that was created after the first urbanization period in Sri Lankan history. The main purpÈe

here is to study the special features of city planning between the first urbanization phase and the second urbanization phase, and through that to study the unique city planning characteristið of the city planning of the Dambadeniya era, which was the first phase of the second urbanization

**Keywords:** Dambadeniya era, King Vijayabhahu,Town planning,Urbanization

**හැඳින්වීම**

පළමුවන නාගරිකරණ අවධියට අයත් අනුරාධපුරය හා පොළොන්නරුවව රාජධානි සමය බිඳවැටීමෙන් පසු ව ලාංකේය දෙවන නාගරීකරණ අවධිය ආරම්භය සිදුවිය. ක්‍රිස්තු වර්ෂ 1232 දී ආරම්භ වූ දඹදෙණි යුගය දශක පහකට ආසන්න කාලයකට දිව යයි. මෙම වකවානුව තුළ සිංහල රජදරුවන් සිව් දෙනෙකු විසින් දේශපාලනික ආගමික සංස්කෘතික සමාජීය හා සාහිත්‍ය ක්ෂේත්‍රවල මනා දිදුල ආලෝකයක් දඹදෙණිය යුගය පෝෂණය කිරීම සිදුවිය. ලංකා වංශ කථා ඉතිහාසයේ විවිධ යුග අතරින් දඹදෙණිය යුගය විද්වතුන්ගේ වැඩිම අවධානයට යොමු විය යුතු පරිච්ඡේදයක් බව හැඟී යන කරුණකි. දඹදෙණිය යුගය වැඩි බහුමානයට පාත්‍ර විය යුතු කාරණා දෙකකි.

- කාලිංග මාඝ වැනි දැඩි ආක්‍රමණයන්ගෙන් බිඳ වැටුණු අනුරාධපුරය හා පොළොන්නරු යුගවලින් පසු ව රජරට මුළුමනින් ම විදේශ ආධිපත්‍යයෙන් මුදවාගැනීමේ ක්‍රමෝපායි සැලසුම් සිදුකරන්නේ දඹදෙණිය කේන්ද්‍රකොට ගෙන ය.
- සිංහල සාහිත්‍ය වංශයේ විවිධත්වයෙන් යුතු සාහිත්‍ය කෘති සම්භාරයක් දඹදෙණියෙන් බිහිවීම

මෙහි දී වැඩි බහුමානයෙන් යුක්ත ව කරුණු සාකච්ඡා කිරීමට හේතුපාදක වන කරුණ වන්නේ විජයබාහු රජුගේ රාජප්‍රාප්තියත් සමඟින් මෙම රාජ්‍ය ගොඩනැගුණ අතර

පොළොන්නරු යුගයේ ඇති වූ ආක්‍රමණ හරහා ආරක්ෂිත රාජධානියක් ගොඩනැඟීමේ අවශ්‍යතාවය මත දඹදෙණි රාජධානියේ නගර සැලසුම්කරණය ඉතා සුවිශේෂී ආකාරයෙන් සිදු වූයේ ආකාරය යි. එහි දී ආරක්ෂාව සහ සිසු අවශ්‍යතා සපිරෙන අයුරින් දඹදෙණි නගර සැලසුම්කරණය නිර්මාණය වූ ආකාරය පිළිබඳ මෙහි දී මෙම පර්යේෂණය සිදුකෙරේ.

## සාහිත්‍ය විමර්ශනය

දඹදෙණි රාජධානිය සහ එයින් ගොඩනැඟුණු රාජ්‍ය පාලනය, ගෘහනිර්මාණය, නගර නිර්මාණය, ආගමික පසුබිම හා සාහිත්‍යය පුනරුදය ආදි විවිධ ක්ෂේත්‍රයන් පිළිබඳ තොරතුරු චුල්ලවග්ග පාලිය, විසුද්ධි මාර්ග ටීකාව හා සාරත්ථදීපනිය වැනි සාහිත්‍යය කෘතිවල අන්තර්ගත වේ. එසේ ම එහි දී සඳහන් වන පරිදි දඹදෙණිය රාජධානිය ඇතුළු නුවර සහ පිටත නුවර වශයෙන් කොටස් දෙකකි. අනුරාධපුර හා පොළොන්නරුව රාජධානි ක්‍රමික සැලසුමක් හරහා සිදු වී නොමැත. මන්ද එම රාජධානි ඉදිවූයේ විදේශීය ආක්‍රමණවලින් එල්ල වූ බලපෑම් අවම කිරීම සඳහා ය. මෙහි දී ඇතුළු නුවර හා පිටත නුවර වෙන් කළ අටලොස් රියනක් උස පවුරකින් වට වී තිබූ බවට තොරතුරු හමු වේ. දඹදෙණි අස්නේ සඳහන් වන ආකාරයට දෙවන පරාක්‍රමබාහු රජු විසින් රජ ගෙවල් වටකොට ගබඩා ගෙවල්, බිසෝ ගෙවල් කරවා ඇත. මහාවංශයට අනුව විජයබා රජු විසන් පර්වතය වටා වාසල් නිර්මාණය කරවූ බව ද සඳහන් වෙයි.[1] තොරතුරු රැස්කිරීම සඳහා ප්‍රාථමික සහ ද්විතීක දත්ත ඇසුරෙන් අධ්‍යයනය කිරීමත් පුස්තකාල අධ්‍යයනය, අන්තර්ජාල අධ්‍යයනයෙන් පර්යේෂණ ක්ෂේත්‍රය හා සබැඳි ලිපි ලේඛන හා වාර්තා පිළිබඳවත් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ සාධක ඇසුරෙන් ලියවන මූලාශ්‍රගත සාධක අධ්‍යයනය කිරීමත් මඟින් මෙම දත්ත හා තොරතුරු රැස්කර ගැනීම සිදු කෙරිණි. එහි දී ගුණාත්මක ක්‍රමවේදයෙන් පර්යේෂණය සඳහා දත්ත රැස් කිරීමට අපේක්ෂා කෙරේ.

**පර්යේෂණ ගැටලුව**


මෙහි දී පර්යේෂණ ගැටලුව වන්නේ ලාංකේය ඉතිහාසයේ පළමු නාගරීකරණ අවධියෙන් පසු ව නිර්මාණය වූ දෙවන නාගරීකරණ අවධියේ මුල් අවස්ථාව වූ දඹදෙණිය රාජධානිය යුගයේ සුවිශේෂී ආකාරයට නිර්මාණය වූ නගර සැලසුම්කරණයක් ඇත්දැයි සාකච්ඡා කිරීම ය.

**පර්යේෂණ අරමුණු**

පර්යේෂණ අරමුණ ලෙස පළමු නාගරීකරණ අවදිය සහ දෙවන නාගරීකරණ අවධියේ ආරම්භක යුගයේ නගර සැලසුම්කරණයට අදාළ ව සුවිශේෂී ලක්‍ෂණ සහිත ව නිර්මාණකරණයක් පිළිබඳ ව අධ්‍යයනය කිරීමත් ය. එහි දී පැරැණි නගර සැලසුම්කරණයෙහි පවතින සුවිශේෂතා අධ්‍යයනය කිරීමත් මෙහි දී සිදු කරනු ලබයි. නගරයක් සැලසුම් කිරීමේ දී සැලකිය යුතු සුවිශේෂී කාරණා මොනවාදැයි මෙම පැරැණි නගර සැලසුම්කරණයේ ශිල්පීය ලක්ෂණ අධ්‍යයනය කිරීම ය. ශ්‍රී ලාංකික පැරණි නගර සැලසුම්කරණය පිළිබඳ අධ්‍යයනය කිරීම අවධි දෙකක් හරහා සිදු කරන අතර එහි දී දෙවන නාගරීකරණ අවධියේ දඹදෙණිය යුගය හා බැඳුණු සුවිශේෂතා අධ්‍යයනය කිරීම අපේක්ෂිත ය.

**සොයාගැනීම්**

රජමාළිගාවේ නටබුන් ඇතුළු නුවර මාළිගා ගලේ බටහිර සීමාවේ දක්නට ලැබේ. මෙම රූපසටහනට



අනුව නගරය තුළ දක්නට ඇති ව්‍යූහාත්මක ස්වභාවය මෙසේ ය. (රූප සටහන් 01)[2]

අක්කර 25ක් පමණ වූ උස්බිම් ප්‍රදේශය ඇතුළු නුවර වශයෙන් සලකයි. ඒ වටා ඇති ශක්තිමත් ප්‍රාකාරයකින් ඇතුළු නුවර සීමා කර ඇති බව මූලාශ්‍රගත තොරතුරුවලට අනුව පැහැදිලි ය. මෙම ප්‍රාකාරය හරහා නගරය කොටස් දෙකකට බෙදා ඇති බව පැහැදිලි ය. ඇතුළු නුවර සම සතරැස් නොවන ප්‍රදේශයක් වටකොට නැගෙනහිරට තබන ලද දොරටුවක් ඇති වේදිකාවකින් යුක්ත ය. චූලවංශයේ සඳහන් වන පරිදි පැරකුම් රජු ඊට පෙර සිටි රජු විසින් කරන ලද ප්‍රාකාරයේ පවුරු පදනම් බිඳ දමා විශාල ලෙස මාළිගාව සහ ප්‍රාකාරයක් කරවූ බව සඳහන් වේ. එහි දී "ස්වකීය නාමයෙන් උපලක්ෂිත වූ සිත්කළු පවුරු වලලු ඇති" යනුවෙන් එහි දක්වා ඇත. ප්‍රාකාරය මඟින් බෙදී ඇති නගරයේ උතුරු කොටසට වඩා දකුණු කොටස විශාලත්වයෙන් යුතු බව පැහැදිලි ය. දඹදෙණිය පැරණි නගරය ඉදිකරන ලද්දේ පිහිටි බිමෙන් අඩි 450ක් පමණ ඉහළට නැගෙන ගල් පර්වතය මුල්කොට ගෙන ය. පර්වතය මස්තකයේ රජමාළිගාව පිහිටුවා ඇත. පර්වතයට නැගෙනහිර දෙසින් අශ්වලාඩමක හැඩයට බිමක් වට කොට ඇතුල් නගර ප්‍රාකාරය ඉදිකර ඇත. එහි දෙකොණ පර්වතයට වැදී නිමාවට පත්වේ. එම පවුරේ උස ආරම්භයේ මීටර 2.5ක් පමණ වන අතර දැනට ඇති උසම ස්ථානය මීටර 1.6 කට සීමා වෙයි. පළල මීටර 1.3ක් පමණ වේ. ඇතුල් නගර පවුර ගොඩනගා ඇත්තේ තරමක මුහුණත සමතලා වන ගල් කුට්ටි වලිනි. ඇතුල් නගරය පර්වතය මැදි වන මැදිවන පරිදි පිට නගර ප්‍රාකාරය ගොඩනගා ගෙන තිබේ. ඊට පිටතින් දිය අගලක් පිහිටුවා තිබූ බවට සාධක හමු වේ. පිට පවුර මැටියෙන් තනා ඇත. මැටි පවුර හා දිය අගල දඹදෙණිය විජේසුන්දරාරාමයට යාබදවා හඳුනාගත හැකි ය. මැටි පවුරේ උස මීටර 1.5ක් පමණ ද පළල මීටර 5.5ක් ද වේ. පිටතින් පිහිටි දිය අගලේ පළලත් මීටර 9ක් ද ගැඹුර මීටර 2ක් ද පමණ වන බව පුරාවිද්‍යාඥයන්ගේ සාධක අනුව තහවුරු වෙයි. පර්වතයේ නැගෙනහිර බෑවුම ඔස්සේ පර්වත මස්තකයට පිවිසීමට පියගැට පෙළක් දක්නට ලැබේ. මෙය

බොහෝ තැන්හි සකස්කළ සියුම් ගල් කුට්ටිවලින් නිර්මාණය කරවා ඇත. ඇතැම් තැන්හි සැකසූ රළුගල් කුට්ටිවලින් සකසා ඇත පියගැට පෙළ දෙපස ගලින් තනා ඇති අත්ටික් ඇත. මෙම පියගැටපෙළ අවසානයේ දී සිංහාසන ගොඩනැගිල්ල නම් වූ නටබුන් ගොනැගිල්ලක් හමු වේ. එය ඇසුරු කරගන්නා ස්ථානයේ රාජකීය ගොඩනැගිලි පරිශ්‍රය තිබෙන්නට ඇතැයි පුරාවිද්‍යාඥයන් අනුමත කරයි. ඇතුළත නගරයේ පර්වත මාලිගා පරිශ්‍රයේ වැඩි ආරක්ෂාව පිණිස පර්වතයේ අභ්‍යන්තර ආරක්ෂක ප්‍රාකාරයක් ඉදි කරවා ඇත. එය ද ගල් කුට්ටි අධාරයෙන් සිදු කරවා ඇත. පිටත නගරය පිළිබඳ අධ්‍යයනය කිරීමේ දී **කත්ගල**[3] නම් වූ විශේෂිත ගොඩනැගිල්ලක් හඳුනාගත හැකි ය. මෙය ගල්තලාවක් මත සිවුරැස් ආකෘතියට සිදු කර ඇති බව ගල්තලාව මත ඇති කුළුණු පාදම් සිදුරු මගින් තහවුරු කරගත හැකි ය. පිටත නගරය ආශ්‍රිත ව සෙසු ගොඩනැගිලි අවශේෂ පරිහානියත් සමඟ ම වර්තමානයේ හඳුනාගත නොහැකි මට්ටමට පත්වී ඇත. නගරය ආශ්‍රිත ගොඩනැගිලි සහ ඒ ආශ්‍රිත ව ඉදි වූ විහාර ගොඩනැගිලි අධ්‍යයනය කිරීමේ දී ටැම්පිට ගොඩනැගිලි කලාවේ මූලික ආරම්භක සාධක හඳුනාගත හැකි ය. අනුරාධපුර පොළොන්නරු යුගවල හමුවන කවාකාර ගොඩනැගිලි ආකෘතිය ද මෙම යුගයේ ගිලිහී ඇත. අනුරාධපුර පොළොන්නරු යුගයන්හි තිබූ ජ්‍යාමිතික නගර සැලසුම් ආකෘතිය ද මෙම යුගයේ හඳුනාගත නොහැකි ය.

මීට අමතර ව මෙම නගර සැලසුම්කරණය අවස්ථාවේදී මැද මිදුලක් සහිත පාදමක් දක්නට ලැබෙන අතර මැද මිදුලට එක් වූ ජලය ඉවත් කිරීමට නිර්මාණය කළ කානු පද්ධතියක් සහිත නටබුන් හමුවීම දක්නට ලැබේ. දඹදෙණි නගරය සැලසුම් කිරීම තුළ පර්වතය මුදුනේ දාරු පවුරකින්, කළුගල් පවුරකින් මෙන් ම මැටි පවුරකින් වට වූ ආකාරය දඹදෙණි අස්න සඳහන් කරයි. නගරය බොහෝ විට සැලසුම් කර ඇත්තේ මධ්‍ය පන්සලක් හෝ රාජකීය මාළිගාවක් වටා වන අතර පරිපාලනය සහ ආගමික කටයුතු සඳහා කේන්ද්‍රස්ථානයක් නිර්මාණය කිරීමට කටයුතු යොදා ඇත.[4] මෙම මධ්‍ය ලක්ෂයෙන් පාරවල් විකාශය වූ අතර එය කාර්යක්ෂමව ගමන් කිරීමට ඉඩ සැලසීමක් ලෙස නගර

සැලසුම් කිරීමේ සුවිශේෂී අංගයක් ලෙස ද හඳුනාගත හැකි ය. මීට අමතර ව උද්‍යාන අලංකරණ අංග ලෙස පොකුණු හා සිංහාසන මණ්ඩප හමුවීම මෙන් ම ඇතුළු නුවර වටා ආරක්ෂිත දිය අගල් පැවතීම ද සුවිශේෂී ලක්ෂණ ලෙස හඳුනාගත හැකි ය. එය කවාකාර ලෙස මාළිගය වටා ම විහිදී තිබුණි. දඹදෙණි රාජධානිය ජලාශ, ඇලමාර්ග සහ පොකුණු ඇතුළු දියුණු වාරි මාර්ග පද්ධතියක් අවධාරණය කරයි. මෙම ජල කළමනාකරණය උපායමාර්ග කෘෂිකර්මාන්තය සඳහා තීරණාත්මක වූ අංගයක් ලෙස ජනගහනය අවශ්‍යතාවය සඳහා නගර සැලසුම්කරණය සුවිශේෂී සැලසුම් කරන අංගයක් ලෙස හඳුනාගත හැකි ය. රජමාළිගාවේ ආරක්ෂාව උදෙසා නිර්මාණය කළ මුරගෙය හා උමංමාර්ග දොරටුවක නටබුන් හමුවී තිබීම මෙහි දී නගර සැලසුම්කරණයේ ආරක්ෂාව සම්බන්ධව සුවිශේෂී කාරණාවක් ඉස්මතු වෙයි. නගරයේ බොහෝ විට ආක්‍රමණවලින් ආරක්ෂා වීම සඳහා ශක්තිමත් විය යුතු හමුදා ව්‍යූහයන් උපායමාර්ගිකව ස්ථානගත කිරීම රාජකීය පවුලේ සහ වැසියන්ගේ ආරක්ෂාව සහතික කිරීම මෙහි දී සිදු කර ඇත. ආගමික පුනර්ජීවනය සඳහා බෙලිගල දළදා මාලිගාව නිර්මාණය වීම විජේසුන්දරාරාමය නිර්මාණය වීම හඳුනාගත හැකි ය. විජේසුන්දරාරාමය හරහා රජු ධර්මයට යොමු වූ බවට ද තොරතුරු සඳහන් වේ. බෞද්ධාමික වැදගත්කම පිළිබිඹු කරමින් විහාරස්ථාන සහ ආරාම නගර සැලසුම්කරණයේ අත්‍යවශ්‍ය අංගයක් විය. ඒවා බොහෝවිට ගොඩනගා ඇත්තේ ආගමික සහ ප්‍රජා අරමුණු දෙකටම ඉඩ සැලසෙන ආකාරයට ය. මීට අමතර ව නගර සැලසුම්කරණයේ ප්‍රධාන ලක්ෂණයක් ලෙස වෙළෙඳාම සහ වාණිජ කටයුතු සඳහා පහසුකම් සැලසීම සඳහා නගර මධ්‍ය ආසන්නව වෙළෙඳ ස්ථාන උපායමාර්ගිකව පිහිටා තිබුණි. මේ ආර්ථික ක්‍රියාකාරකම් සහ ජනතාව අතර අන්තර් ක්‍රියාකාරකම් දිරිමත් කිරීම සඳහා යොදාගත් ක්‍රම ශිල්පයක් ලෙස හඳුනාගත හැකි ය. නගරයේ සැලසුම ස්වභාවික භූදර්ශනය ලෙස සලකන අතර නාගරික ජීවිතයේ සෞන්දර්යාත්මක සහ ක්‍රියාකාරී අංගයක් වැඩිදියුණු කිරීම සඳහා ඒවා භාවිත කර ඇත. පොදු අවකාශයන් සහ උද්‍යාන සැලසුම් කිරීමේ දී ස්වභාවික ලක්ෂණ බොහෝ විට ඇතුළත් වන ආකාරයට නගරය සැලසුම් කිරීමට

යෝජනා සිදුකර ඇති ආකාරය නගර සැලසුම්කරණය අධ්‍යයනය කිරීමේ දී හඳුනාගත හැකි ය.[5] මෙහි දී පෙනී යන්නේ නගර සැලසුම් කිරීම පොදු මහජනතාවගේ සුබ සිද්ධිය උදෙසා ඉතා ක්‍රමානුකූල මට්ටමකින් නිර්මාණය වූ ආකාරයෙන් පැහැදිලි වේ.

## සමාලෝචනය

පළමු නාගරීකරණ අවධිය හරහා ලබා ගත් අත්දැකීම් හා දේශපාලන තත්ත්වය, රාජ්‍ය පාලනය හරහා දෙවන නාගරීකරණ අවධිය ආරම්භය දඹදෙණි යුගය හරහා සිදු විය. එහි දී නගර සැලසුම්කරණය ඉතා සූක්ෂමකාරී, ආරක්ෂාකාරී සහ බුද්ධිමත් ආකාරයට නිර්මාණය කිරීමට කටයුතු සලසා ඇති බව හඳුනාගත හැකි ය. පවුරු නිර්මාණය කිරීම දිය අගල් නිර්මාණය සහ සුවිශේෂී ගෘහාංගයක් වූ ටැම්පිට විහාර නිර්මාණය වැනි විවිධ ක්‍රමශිල්ප මගින් නගර සැලසුම්කරණය ඉතා සූක්‍ෂමකාරී ව නිර්මාණය කර ඇති ආකාරය හඳුනාගත හැක ය. එසේ ම කළමනාකාරීත්වයකින් යුක්ත ව ආගමික සහජීවනය සාහිත්‍ය පුනරුදයක් හරහා නගරයක් නිර්මාණය වීමේ දී සිදුකරනු ලබන අවශ්‍යතා සපිරීම නගර සැලසුම්කරණය හරහා රාජ්‍ය පාලනය හරහා සාමාන්‍ය ජනතාවට ලබාදුන් අභියෝගාත්මක නගර සැලසුම්කරණයක් මෙහි දී හඳුනාගත හැකි ය.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

### ද්විතීයික මූලශ්‍රය


අමරසිංහ, මාලිංග. (2003). *ශ්‍රී ලංකාවේ පුරාණ රජමාළිගා*, සමන්ති පොත් ප්‍රකාශකයෝ, වැලිගම්පිටිය

සිරිවර්ධන, ඩබ්.ඒ (2015) *ශ්‍රී ලංකාවේ ඓතිහාසික සහ වර්තමාන නිර්මාණ සංකල්ප*

දිසානායක,සෙනරත් (2012) *අසිරිමත් දඹදෙණිය*

මල්සිරි, ඉෂංක (2011) *ශ්‍රී ලංකා වාස්තුවිද්‍යා උරුම සංරක්ෂණ ඓතිහාසික විකාශය*, ඇස් ගොඩගේ සහ සහෝදරයෝ